# පරීක්ෂක වාර්තාව

## අදියර II විභාගය - 2023 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙය ලකුණු 25ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්නයකි. 2020 විෂය නිර්දේශය යටතේ **උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය** විෂය ආවරණය වන පරිදි අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ඇත. ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත්ව තිබූ අතර බොහෝ අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10-20 අතර ලබා ගෙන තිබුණි. එමෙන්ම, ඉතා සුළු අපේක්ෂකයන් කිහිපදෙනෙකු ලකුණු 05ට වඩා අඩුවෙන් ලබාගෙන තිබුණි.

පිළිතුරු ඇගයීමේදී දක්නට ලැබුණු පොදු දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**(1.1)** මෙම ප්‍රශ්නය පිරිවැය මධ්‍යස්ථානයක් සඳහා වන උදාහරණයක් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර, තවත් අයදුම්කරුවන් පිරිසක් පිරිවැය මධ්‍යස්ථානය නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි. නිවැරදි පිළිතුර (2) විය යුතුය.

**(1.2)** මෙම ප්‍රශ්නය මගින් යම් වියදමකට අදාලව කලින් කළ ගෙවීම්, උපචිත වියදම් සහ වර්ෂයට අදාල ප්‍රමාණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර, තවත් සමහර අයදුම්කරුවන්ට නියමිත ලකුණු ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**(1.3)** යෙදවුම් හා නිමවුම් වලට අදාලව එකතු කළ අගය මත බද්ද (VAT) ගණනය කිරීම පිළිබඳව දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා නොතිබුණි.

**(1.4)** විශේෂිත ඇණවුම් පිරිවැයකරණ ක්‍රම/ය පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 02 ම ලබාගෙන තිබූ අතර, ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් විශේෂිත ඇණවුම් පිරිවැයකරණ ක්‍රම හඳුනාගැනීමට අපොහොසත් වී තිබුණි.

**(1.5)** මෙම ප්‍රශ්නය මගින් 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අදාලව ප්‍රකාශයක් පරීක්ෂා කරන ලද අතර, බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු පිළිබඳව සතුටුදායක විය හැකිය. නිවැරදි පිළිතුර වන්නේ (3) වන උත්තරය යි.

**(1.6)** මෙම ප්‍රශ්නය මගින් කැප කළ අනුපාතය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද අතර, බොහෝ අයදුම්කරුවන්ගේ ගණිත විෂය පිළිබඳව ඇති දැනුම මදහාවය හේතුවෙන් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට අපොහොසත් වී ඇත. නමුත් සමහර අයදුම්කරුවන් කැප කළ අනුපාතය 1/6 ලෙස ගණනය කර නිවැරදිව පිළිතුරු දී තිබුණි.

**(1.7)** මෙම ප්‍රශ්නය මූල්‍ය ප්‍රකාශනවල සංරචක තුනක් (03) හඳුනා ගැනීම අපේක්ෂා කර තිබූ අතර, බොහෝ අයදුම්කරුවන් මූල්‍ය ප්‍රකාශනවල සංරචක හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි. සුළු අයදුම්කරුවන් පිරිසක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සටහන් සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළිතුරු ලෙස සපයා සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි.

(1.8) මෙම ප්‍රශ්නයෙන් කම්කරුවෙකුගේ දිනක ඉපැයීම ගණනය කිරීම අපෙක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් ඉතිරි කළ කාලය ගණනය කිරීමට අපොහොසත්ව තිබූ අතර, ඒ නිසා ප්‍රසාද දීමනාව වැරදි ලෙස ගණනය කිරීම හේතුවෙන් දිනක ඉපැයීම නිවැරදිව ගණනය කිරීමට අසමත් වී තිබුණි.

(1.9) පොදු සමාගමක කොටස් නිකුතුව හා සම්බන්ධව ජර්නල සටහන් පිළියෙල කිරීම අපේක්ෂා කරන ලද අතර සමහර අයදුම්කරුවන් අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කිරීම සිදුකර නොමැත. ජර්නල සටහන් පිළියෙල කිරීම ප්‍රශ්නයෙන් අසා තිබුනද, සමහර අයදුම්කරුවන් විසින් "T" ගිණුම් සකස් කර තිබුණි.

(1.10) මෙම ප්‍රශ්නය මගින් ලබා දී ඇති තොරතුරු සහ සූත්‍රය උපයෝගී කරගෙන යම් නිෂ්පාදනයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කිරීම අපේක්ෂා කරන ලද අතර සමහර අයදුම්කරුවන් ලබා දී ඇති දත්ත සූත්‍රයට නිවැරදිව ආදේශ කිරීමට අපොහොසත් වී ඇත.

පැහැදිලිව සඳහන් කර ඇති උපදෙස් පිළිපැදීමකින් තොරව, ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ම ලකුණු කර ඇත. ඇතැම් අයදුම්කරුවන් එසේ පිළිතුරු සැපයූ ප්‍රශ්න පත්‍රය පිළිතුරු පොතට අමුණා තිබූ අතර, ඇතැමුන්ට එසේ කිරීමට ද අමතක වී තිබූ බවද පෙනුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

දී ඇති තොරතුරු මත පදනම්ව වෙළඳ ණය ගැතියන්ගේ සහ වෙළඳ ණය හිමියන්ගේ පාලන ගිණුම් සහ කේවල ස්වාමි ව්‍යාපාරයක ප්‍රාග්ධනය ගණනය කිරීම පරීක්ෂා කර ඇත. සමහර අයදුම්කරුවන් පාලන ගිණුම්වල ආරම්භක ශේෂයන් ඇතුළත් කර නොතිබූ අතර, සමහර අයදුම්කරුවන් ව්‍යාපාරයේ හිමිකම ගණනය කර නොතිබුණි. එසේම, සමහර අයදුම්කරුවන් විකුණුම් අගය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් හවුල් ගිණුම් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. ලාභා`ලාභ විසර්ජන ගිණුම සහ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පිළියෙල කිරීම බලාපොරොත්තු විය.

නිරීක්ෂණය කරන ලද පොදු වැරදි පහත පරිදි වේ:

(1) සමහර අයදුම්කරුවන් හවුල් ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමේ දී, පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කරන ලද හවුල්කරුවන්ගේ වැටුප් ගලපා නොතිබුණි.

(2) ණය පොලිය අදාළ වර්ෂයේ මාස හයක් සඳහා පමණක් අදාළ වුවද, බොහෝ අයදුම්කරුවන් මාස දොළහක කාලයක් සඳහා ණය පොලිය ගණනය කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් සහ වියදම් ගිණුම සහ සාමාජික ගාස්තු ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී.

නිරීක්ෂණය කරන ලද පොදු වැරදි පහත දක්වා ඇත:

(1) සමහර අයදුම්කරුවන් විසින් සාමාජික ගාස්තු ගිණුම නිවැරදිව පිළියෙල කර නොතිබූ අතර එකී ගිණුමට අදාළ හර සහ බැර ගණුදෙනු නිසි ලෙස සටහන් කර නොතිබුණි.

(2) සමහර අයදුම්කරුවන් සාමාජික ගාස්තු ගිණුම පිළියෙල කිරීමට උත්සාහ කර නොතිබුණි.

(3) ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් ලැබීම් සහ ගෙවීම් ගිණුමේ ආරම්භක ශේෂය ආදායම් සහ වියදම් ගිණුමට ඇතුළත් කර තිබූ අතර මෙය සම්පූර්ණයෙන්ම වැරදිය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

**(A)** හරිත සාමාන්‍ය මිල ක්‍රමය යටතේ අමුද්‍රව්‍ය X වලට අදාලව ගබඩා ලෙජරය පිළියෙල කිරීම අපේක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් පිරිසක් සතුටුදායක ලෙස පිළිතුරු සපයා තිබුණි. අයදුම්කරුවන් ඉතා සුළු පිරිසකට ඒකක 800 ක් වූ ආරම්භක තොගය  ගබඩා ලෙජරයට ඇතුළත් කිරීමට අපොහොසත් වීම නිසා ලකුණු කිහිපයක් අහිමි කරගෙන තිබුණි.

**(B)** ප්‍රශ්නයේ සඳහන් කර ඇති සේවකයකුගේ ශුද්ධ වැටුප ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී, ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයාගේ දායකත්වය සමඟ සේවාදායකයාගේ දායකත්වය අඩු කර ඇත.

තවද, ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් සතිපතා ආහාර දීමනාව වන රු.2,500/- මාසික දීමනාව ලෙස වැරදියට වටහාගෙන ඇත.

සමහර අයදුම්කරුවන් අතිකාල ආදායම දළ වැටුප ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

**(a)** ලබා දී ඇති පොදු කාර්ය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර බෙදාහැරීම දැක්වෙන ප්‍රකාශනයක් සකස් කිරීම අපේක්ෂා කරන ලද අතර බොහෝ අයදුම්කරුවන් එම ප්‍රකාශනය සතුටුදායක ලෙස සකස් කර තිබූ අතර ඉතා සුළු පිරිසක් පොදුකාර්ය ප්‍රතිපාදනය කිරීමට භාවිතා කරන ලද පදනම සඳහන් කර නොතිබුණි.

සමහර අයදුම්කරුවන් සේවා දෙපාර්තමේන්තුවේ පිරිවැය නැවත නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර බෙදා හැර දැක්මට අසමත් වී තිබුණි.

**(b)** එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා ඍජු ශ්‍රම පැය මත පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කිරීම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූ අතර, බොහෝ අයදුම්කරුවන් පොදු කාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය නිවැරදිව ගණනය කර තිබුණි.

ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් ඍජු ශ්‍රම පැයකට අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>C කොටස</u>

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය සී/ස පෞද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පරීක්ෂා කරන ලද අතර **(a)** සහ **(b)** ලෙස කොටස් 2 කින් සමන්විත වේ. **(a) කොටසින්** ලාභා'ලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කර ඇති අතර **(b) කොටස** මගින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කර ඇත.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර ඇති අතර සමහර අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් වී ඇත.

පහත දුර්වලතා නිරීක්ෂණය විය:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) සමහර අපේක්ෂකයින් විසින් ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා සාමාන්‍යයෙන් පිළිගත් ආකෘති අනුගමනය කර නොතිබුණි.

(2) සමහර අයදුම්කරුවන් මෝටර් රථ බැහැර කිරීමේ ලාභය නිවැරදිව ගණනය කර නොතිබුණි. ඒ වගේම මෝටර් රථ වලට අදාල ක්ෂය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(3) උපචිත විදුලිය නිසි ලෙස පෙන්වා නොතිබුණි.

(4) සමහර අයදුම්කරුවන් ආදායම් බදු ගැලපීම නිවැරදිව සිදු කර නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් පෙරවැඩ අමුණා නොතිබූ නිසා ඔවුන්ට පෙරවැඩ සඳහා වෙන් කර තිබූ තවත් ලකුණු කිහිපයක් ලබා ගැනීමට නොහැකි විය.

(6) බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව අවසාන තොගය ගලපා නොතිබුණි.

(7) සමහර අයදුම්කරුවන් තොග හානිය වෙළඳ ගිණුමේ ගලපා ඇති අතර තවත් සමහර අයදුම්කරුවන් ලාභා'ලාභ ගිණුමේ නිවැරදිව ගලපා ඇත.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී තොගය ශුද්ධ උපලබ්ධි අගයට ගෙන නොතිබුණි.

(2) සමහර අයදුම්කරුවන් බොල් ණය සඳහා ප්‍රතිපාදනය වෙළඳ ලැබිය යුතු මුදල් වලින් අඩු කර නොතිබුණි.

(3) සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වියදම් පෙන්වා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

\- * * * -